## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය - 2015

-----------------------------------------------------------------

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2015 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971අංක 38දරන මුදල් පනතේ 13(1)වගන්තිය සහ 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ 10(3)වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4)උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විනිශ්වයකාරවරයන්ගේ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු.125,839 ක් අඩුවෙන් දැක්වුණි. එයින් පෙර වර්ෂවලට අදාළ රු.66,442 හා සමාලෝචිත වර්ෂයට අදාළ රු.59,397 හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.

(ආ) පරිත්‍යාග ලෙස ලද පොත් 570 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකරණ ජාලගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.48,469 ගිණුම්ගත කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 137 හා 138 | ගෙවීම් වවුචර් අනුමත කිරීමකින් හෝ සහතික කිරීමකින් තොරව පුහුණු වැඩසටහන් සඳහා රු.449,745 ක අත්තිකාරම් ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 7.1 ඡේදය | මසකට පැය 20 ඉක්මවා අතිකාල ලෙස සේවකයින් 07 දෙනෙකුට ගෙවන ලද රු.124,179 ක් සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2004 ජනවාරි 26 දිනැති අංක 2004/පුස්ත/01 දරන පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල චක්‍රලේඛයේ 3.1 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති රු.2,285,125 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,902,742 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,196,073 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,293,331 ක පිරිහීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ලැබීම් රු.2,632,807 ක් අඩුවීමත් වැටුප් හා වේතන රු.1,955,183 ක වැඩිවීමත් මූල්‍ය ප්‍රතිඵලයේ මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී රු.2,581,136 ක්වූ 2011 වර්ෂයේ අතිරික්තය 2012 වර්ෂය වනවිට රු.5,340,626 ක ඌනතාතවයක් දක්වා පිරිහී තිබුණි. 2013 වර්ෂය වනවිට රු.2,131,221 ක අතිරික්තයක් වූ එය 2014 වර්ෂයේදී රු.6,196,073 දක්වා වර්ධනය වුවද 2015 වර්ෂයේදී නැවතත් රු.1,902,742 දක්වා පිරිහී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී රු.4,318,220 ක්වූ 2011 වර්ෂයේ දායකත්වය 2012 වර්ෂය වනවිට රු.4,139,605 ක සෘණ අගයක් වී තිබුණු අතර 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් රු.3,441,756 ක හා රු.9,321,632 ක ධන අගයක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද ආයතනයේ දායකත්වය 2015 වර්ෂයේදී නැවතත් රු.7,670,047ක් දක්වා පිරිහී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනත ප්‍රකාරව අධිකරණ නිලධාරීන්ගේ වෘත්තීය ප්‍රවීනත්වය වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා රැස්වීම්, සම්මේලන, දේශන, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම ආයතනයේ ප්‍රධාන පරමාර්ථය වී තිබුණි.

ඉහත අරමුණු ඉටුකරගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) (i) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අධිකරණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 56 ක් හා වැඩමුළු 08 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද කාර්යසාධන වාර්තාව අනුව පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 23 ක් හා වැඩමුළු සංඛ්‍යාව 01 ක් විය. මේ අනුව සමස්ත කාර්යසාධන ප්‍රතිශතය 37.3 ක් විය.

(ii) මහාධිකරණ විනිසුරුවරුන්, දිස්ත්‍රික් විනිසුරුවරුන් හා මහේස්ත්‍රාත්වරුන්, කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීමේ කාලය දිනකට පැය 03 කට සීමා වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට පැය 66 ක් පමණක් වැඩ සටහන් පවත්වා තිබූ අතර ඒ සඳහා රු. 2,684,400 ක් ගෙවා තිබීමෙන් පැයක වියදම රු.40,672 ක් වී තිබුණි.

(ආ) අධිකරණ ජාලගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2013 වර්ෂයේ සිට 2015 ඔක්තෝබර් දක්වා රු.732,845 ක් වියදම් කර ඇතත් මෙම ව්‍යාපෘතියේ පහසුකම් භාවිතා කර සම්මන්ත්‍රණ පැවැත්වීමට අපොහොසත්වී තිබුණි.

## 4.2 අරමුදල් ඌන උපයෝජනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව ආයතනය විසින් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ වර්ෂය පුරා අවම ශේෂය ලෙස රු. මිලියන 13.5 ක මුදලක් උපයෝජනය කිරීමෙන් තොරව පැවතුණු අතර එය කෙටි කාලීන ආයෝජන මාර්ගවල යොදවා ගැනීම පිළිබඳව ආයතනයේ අවධානය යොමුවී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

## 5.1 අයවැය ලේඛනමය පාලනය

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 12 හි 5.2.5 ඡේදය අනුව සෑම මුදල් වර්ෂයක් වෙනුවෙන්ම අයවැය ලේඛනයක් පිළියෙල කර අදාල මුදල් වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර ආයතනයේ පාලක මණ්ඩලයෙන් අනුමත කරවාගෙන එහි පිටපතක් අදාල වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) විෂයයන් 18 ක අයවැයගත හා තථ්‍ය ආදායම හා අයවැයගත හා තථ්‍ය වියදම අතර සියයට 23 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.